| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ඌනතාවය | (80,675,548) | (37,566,757) |
| දේපළ පිරියත උපකරණ විකිණීමෙන් ලත් ලාභය | 826,517 | - |
| ශුද්ධ අතිරික්තය/ඌනතා වෙනත් සාමාන්‍ය අයිතම පෙර | (1,058,977,401) | (987,357,913) |
| වෙනත් අතිරේක සාමාන්‍ය අයිතමයන් | (42,283,785) | (34,052,731) |
| ශුද්ධ අතිරික්තය/ඌනතාවය | (1,181,110,217) | (1,058,977,401) |

**සටහන් :** වෙනත් අතිරේක සාමාන්‍ය අයිතමයන්ට පසුගිය වර්ෂයේ ගැලපීම් ඇතුලත්ය.

උපකුලපති,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

**ශ්‍රී ජයවර්ධපුර විශ්වවිද්‍යාලය**

2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මුල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ (III) වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා (7) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය හා මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 **විගණන විෂය පථය**

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මුල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී, මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි පරීක්ෂා කිරීම, මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම සහ වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මුල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසුද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණයයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. **මුල්‍ය ප්‍රකාශන**

2.1 *මතය*

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම්, අනුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය 2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මුල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම් හැර 2006 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධපුර විශ්වවිද්‍යාලයේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් උක්ත පොත්පත්වලට එකඟව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සහ මුල්‍ය ප්‍රකාශන සමග දී ඇති සටහන් (අංක 01 සිට 20 දක්වා) වලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත්, මා දරන්නා වූ මතය වේ.

2.2 **මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති*

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් භාවිතයට ගන්නා වත්කම් ප්‍රමිත 18 හි විධිවිධාන ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි. මුළු පිරිවැය රු.14,056,745 ක් වූ ජල සැපයුම් පද්ධතිය, දුරකථන පුවරුව හා විදුලි සැපයුම් පද්ධතිය එම වත්කම්වලට ඇතුළත් විය.

(ආ) ඊට අමතරව රු. 735,499,868 ක සමුච්චිත ක්ෂය අගයකින් යුත් ගොඩනැගිලි, වාහන, පොත්පත්, විද්‍යාගාර, උපකරණ කාර්යාල උපකරණ හා උපාධි ලෝගු ද ප්‍රමිත අංක 18 ට අනුව ප්‍රත්‍යාගණය කර නොතිබුණි.

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අධික මුදලක් වැය කළ යුතු බැවින් ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රතිපත්තියක් වශයෙන් අනුගමනය කිරීමට නොහැකි බව උපකුලපතිවරයා විසින් දන්වා තිබුණි.

2.2.2 *ගණකාධිකරණ අඩුපාඩු*

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පාඨමාලා ආදායම් ලෙස රු. මිලියන 10.4 ක් මුල්‍ය ප්‍රකාශනයන්හි පෙන්නුම් කළත් පශ්චාත් උපාධි පීඨයේ වර්ගීකරණ ලේඛනයට අනුව වර්ෂය තුළ මුළු ලැබීම් රු. මිලියන 26 ක් විය.

(ආ) ආයෝජන වෙනුවෙන් වූ පොලී ආදායම ගිණුම්ගත කිරීමේදී උපචිත සංකල්පය අනුගමනය කර නොතිබුණ අතර, ලැබූ පොලී මුළු ප්‍රමාණයම ආදායමට ගිණුම්ගත කර තිබුණි.

2.2.3 *ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්*

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) විශ්වවිද්‍යාලයට ලැබිය යුතු රු. 66,523,966 ක් හා විශ්වවිද්‍යාලය විසින් ගෙවිය යුතු රු. 19,103,205 ක් පිළිබඳව අදාල පාර්ශ්වයන් විසින් සනාථ කර නොතිබුණු අතර එම ගනුදෙනු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ කීපයක සිට අය නොවී පවතින එකතුව රු. 2,582,800 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට හා වැඩිපුර අයකර ගෙන ඇති රු. 55,089 ක මුදල නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. ණය ලබාදුන් ඇතැම් නිලධාරීන්ගේ ණය වාරික අයකර ගැනීමට ප්‍රමාද කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී සේවක ණය ශේෂ රු.14,540 ක් අඩුවෙන් ද රු. 2,290 ක් වැඩියෙන් ද ගිණුම් ගත කර තිබුණි.

(ඇ) විදේශ ශිෂ්‍යත්ව මත අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වන ආචාර්යවරුන් සම්බන්ධයෙන් තොරතුරු සඳහන් විධිමත් ලේඛනයක් පවත්වා නොතිබුණි. එසේ විදේශගතව සිට නියමිත කාලයට පසු ආපසු සේවයට වාර්තා නොකර ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ සංඛ්‍යාව 43 ක් වූ අතර, ඔවුන් විසින් ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් වන්දි වශයෙන් රු. 36,250,676 ක් විශ්වවිද්‍යාලයට අයවිය යුතුව තිබුණි. එම මුදල් අයකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 *නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම*

පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| *නීති, රීති යනාදියට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු. රෙ. 104(1) | බහු මාධ්‍ය රූප දක්වන යන්ත්‍රය නැතිවීමට අදාලව වගකිවයුත්තන් තීරණය කර ඒ අනුව ඔවුන්ගෙන් අලාභ පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මු. රෙ. 373 | සමාලෝචිත වර්ෂයේ සුළු මුදල් අග්‍රිම ශේෂය දෙසැම්බර් මස 31 දිනට පියවිය යුතු වුවත් එකතුව රු. 156,394 ක අග්‍රිම ශේෂය පියවා නොතිබුණි. |
| (iii) මු. රෙ. 757(2) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඌනතා රු. 23,360 ක් හා අතිරික්තතා රු. 29,691 ක් සම්බන්ධයෙන් නියමිත ක්‍රියාමර්ග ගෙන නොතිබුණි. |
| (iv) මු. රෙ. 772 | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් පාවිච්චියට නුසුදුසු හැටියට ප්‍රකාශ කර තිබෙන රු. 74,980 ක් වූ භාණ්ඩ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) රජයේ ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය | |
| 149 ඡේදය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයට අයත් රු. 2,327,250 ක් වූ පැරණි දේශන ශාලා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවෙහි කාලය 2005 නොවැම්බර් මස 01 දිනෙන් අවසන් වී ඇතත් 2006 ඔක්තෝබර් මස 18 දින දක්වා ද වැඩ අවසන් කර නොතිබුණ අතර, කාලය දීර්ඝ කිරීමද කර නොතිබුණි. |
| (ඇ) *රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ* | |
| 2001 ජූලි 10 දින හා අංක 17/2001 දරන චක්‍රලේඛය | විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකු නැවත සේවයෙහි යොදවා 2006 මැයි සිට අගෝස්තු දක්වා දීමනා ලෙස රු. 245,429 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ඈ) *විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ* | |
| 1985 අගෝස්තු මස 16 දින හා අංක 305 දරන චක්‍රලේඛය | ආචාර්යවරයෙකුට උසස්වීම් ලබාදී, එම උසස්වීම් පෙරදාතම් කර ඒ වෙනුවෙන් රු. 855,269 ක හිඟ වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

2.2.5 *ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු*

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වෙනත් විශ්වවිද්‍යාලවල සේවයේ යෙදී සිටිමින් සප්ත වාර්ෂික නිවාඩු ලබා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාවකාලික තනතුරු දරන ලද නිලධාරීන්ට 2000 වර්ෂයේ සිට මේ දක්වා දීමනා වශයෙන් රු. 934,947 ක් ගෙවා තිබුණ නමුත් මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) ගාස්තු අයකර පවත්වාගෙන යන බහු අවයවයික හා තාක්ෂණ විද්‍යාපති පාඨමාලාවට අදාළ අයවැය ඇස්තමේන්තු අනුව 22%ක ඉතිරියක් ලැබෙන පරිදි සැලසුම් කර තිබුණි. එසේ වුවද පසුගිය වර්ෂයන්හි ඉතිරිවී තිබූ ආදායම් විශ්වවිද්‍යාල අරමුදලට බැරකළයුතු වුවද එසේ බැර නොකර එම ආදායමින් රු.668,228 ක් වැයකර (Mechanical Stability Time) යන්ත්‍රයකින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණි.

3. *මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය*

3.1 *මූල්‍ය සමාලෝචනය*

3.1.1 *මූල්‍ය ප්‍රතිඵල*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 908,325,284 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූපව රු. 698,633,139 ක ඌනතාවයක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 827,649,735 ක ප්‍රදානය හේතුකොටගෙන සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 80,675,549 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 661,066,382 ක රජයේ ප්‍රදානය ලැබීම් හේතුකොටගෙන එම වර්ෂයේ ඌනතාවය රු. 37,566,757 ක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 37.4 ක් හෙවත් 70% ක වැඩිවීමක් නියෝජනය වූ වෙනත් ආදායම් රු. මිලියන 63.7ක් රජයේ ප්‍රදානයට අමතරව උපයා තිබුණි.

3.2 **මෙහෙයුම් සමාලෝචනය**

3.2.1 *අධ්‍යයන කටයුතු*

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) විශ්වවිද්‍යාලයේ පීඨයන් 4 හි ශිෂ්‍යයින් 7094 ක් අධ්‍යාපනය ලබමින් සිටි අතර, ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 978,932,558 ක පිරිවැයක් දරා තිබුණි. එක් ශිෂ්‍යයකු වෙනුවෙන් වාර්ෂිකව දරා ඇති පිරිවැය රු. 137,994 ක් විය.

(ආ) වෛද්‍ය, කළමනාකරණ හා ශාස්ත්‍ර පීඨවල නවක සිසුන් ඇතුළත් කර ගැනීමේ වර්ධනයක් හෝ සමාන තත්ත්වයක් පෙන්නුම් කළත් ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි පාඨමාලා දෙකක සැලකිය යුතු අඩුවීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | *ඇතුළත් කරගෙන ඇති ශිෂ්‍ය සංඛ්‍යාව* | | *නවක සිසුන් ඇතුළත්වීමේ අඩුවීම* | |
|---|---|---|---|---|
| පාඨමාලා වර්ෂය | 2004/2005 | 2005/2006 | 2004/2005 | 2005/2006 |
| | | | ප්‍රමාණය | ප්‍රතිශතය |
| ජීව විද්‍යා | 94 | 68 | 26 | 28 |
| භෞතික විද්‍යා | 196 | 149 | 47 | 24 |

(ඇ) පශ්චාත් උපාධි පීඨයෙහි ශිෂ්‍යයන් 1745 ක් අධ්‍යයන කටයුතුවල නිරත වන අතර, රු. 3,048,305 ආදායමක් සමාලෝචිත වර්ෂය තුළ උපයාගෙන තිබුණි.

(ඈ) බාහිර විභාග අංශයේ 2006 වර්ෂයට ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 13,555 ක් වන අතර එහි ආදායම රු. 47,029,569 ක් විය. කෙසේ වුවද බාහිර විභාග පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම සඳහා මාස 11 ක කාලයක් ගතකර තිබුණි.

(ඉ) අභ්‍යන්තර විභාගවල පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම වෙනුවෙන් වෛද්‍ය පීඨය හැර අනෙකුත් පීඨයන් මාස 06 කට අධික කාලයක් ගත කිරීම හේතුවෙන් ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ඊ) විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය 432 ක් වන අතර, සමාලෝචිත වර්ෂය තුළ එයින් 83 ක් සප්ත වාර්ෂික නිවාඩු හෝ අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබුණි.

3.2.2 *පර්යේෂණ පිළිබඳ කාර්ය සාධනය*

(අ) පීඨවලින් සිදුකරන ලද පර්යේෂණවලට අදාළ අවසාන වාර්තා කාලය ඉකුත් වී තිබියදීත් අදාළ පර්යේෂකයින් විසින් 2006 දෙසැම්බර් 31 දිනය වනවිටත් භාරදී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| *පර්යේෂණ පැවරුම* | *අධ්‍යයන පීඨය* | *අවසන් වාර්තාව භාරදිය යුතු දිනය* |
|---|---|---|
| ඒඑස්පී/06/ආර්ඊ/2000/11 | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ | 2006 අප්‍රේල් |
| ඒඑස්පී/06/ආර්ඊ/2000/01 | ව්‍යවහාරික විද්‍යා | 2006 ඔක්තෝබර් |
| ඒඑස්පී/06/ආර්ඊ/2003/09 | වෛද්‍ය විද්‍යා | 2005 අගෝස්තු |
| ඒඑස්පී/06/ආර්ඊ/2004/06 | එම | 2006 ජනවාරි |
| ඒඑස්පී/06/ආර්ඊ/2005/12 | එම | 2006 ඔක්තෝබර් |

(ආ) කථිකාචාර්යවරුන් පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමෙන් පසු සෑම තෙමසකට වරක් ම අතුරු වාර්තාවන්ද ඊට අමතරව සෑම හය මාසයකට වරක් ම අර්ධ වාර්ෂික වාර්තාවන් ද කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව ක්‍රියාකර නොතිබුණි.

3.2.3 *නේවාසිකාගාර පරිපාලනය*

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) නේවාසිකාගාරවල අනවසර ශිෂ්‍යයන් අධික සංඛ්‍යාවක් පදිංචිව සිටින අතර, මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ ලියාපදිංචි ශිෂ්‍යයින්ට අවම පහසුකම් ලබා ගැනීමට නොහැකි වීමයි. මේ තත්ත්වය අනුව නේවාසිකාගාර පවත්වාගෙන යාම සඳහා අධික වියදමක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදුවී තිබුණි.

(ආ) ශිෂ්‍යයන් 543 ක් සඳහා පෞද්ගලික අංශයෙන් බදු කුලී පදනම මත නිවාස 14 ක් ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී බදු කුලී වශයෙන් රු. 5,391,000 ක් ගෙවා තිබුණි. ඒක ශිෂ්‍ය සාමාන්‍ය බදුකුලී පිරිවැය වර්ෂයකට රු. 9,928 ක් විය.

3.3 *කළමනාකරණ අකාර්යක්ෂමතා*

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 1995 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා ආයතනයේ වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සහ ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් වන්දි අයකර ගැනීමේ කටයුතු නිමා කිරීම සඳහා පැවරුම් පදනම මත පත්කළ උපදේශකවරුන් දෙදෙනෙකු වෙනුවෙන් දීමනා වශයෙන් රු. 1,229,214 ක් ගෙවා තිබුණ ද පවරා තිබූ කාර්යයන්ගෙන් ඉටු වී ඇත්තේ 2004 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා මුද්‍රණයට භාරදීම හා 2005 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ මූලික කටයුතු අවසන් කර තිබීම පමණක් බව අනාවරණය විය.

(ආ) පර්යේෂණ අත්තිකාරම් පියවීමේ ප්‍රමාද වීම් නිරීක්ෂණය වූ අතර, 2006 දෙසැම්බර් 31 දින වන විට රු. 103,000 ක මුදලක් පියවා නොතිබුණි. ඉන් රු. 75,000 ක් සේවයෙන් ඉවත් වූ ආචාර්යවරයෙකුගෙන් ලැබිය යුතු විය.

(ඇ) ගිවිසුම් කඩ කිරීමට අදාළ බැඳුම්කර වටිනාකම ගණනය කිරීමේදී නිවැරදි වටිනාකම තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් ලියවිලි ගොනුගත නොකිරීම, අදාළ වන්දි අයකර ගැනීමට කඩිනම් හා ප්‍රමාණවත් කාර්යයන් සිදු නොකිරීම, බැඳුම්කර වටිනාකම් වාරික වශයෙන් අය කිරීමට තීරණය කිරීම සහ එම වාරික අය කිරීමට අදාළ පසු විපරම් ක්‍රියාවලියක් නොතිබීම ද ප්‍රධාන අඩුපාඩු වශයෙන් විගණන පරීක්ෂණවල දී හෙළිදරව් විය.

(ඈ) 2004 වර්ෂයේ දහම් පාසැල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ආරම්භ කර තිබුණ ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාලයට ලැබුණු රු. මිලියන 3.5 කින් රු. 131,419 ක් වැයකර තිබුණු අතර, වර්ෂ 2කට වැඩි කාලයක් ගතවී ඇතත්, ව්‍යාපෘතිය මන්දගාමීව සිදුවන බව එහි ප්‍රගතිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඉ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩම පවරා ගැනීම වෙනුවෙන් 1998 වර්ෂය දක්වා රු. මිලියන 24 ක් අවස්ථා තුනකදී ගෙවා ඇතත් එම ඉඩම විශ්වවිද්‍යාලයට පවරාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණුද නිරීක්ෂණය විය.

(i) බස්නාහිර පළාත් සභාව එම ඉඩම පවරා දීම සඳහා රු. මිලියන 80 දක්වා අගය වැඩිකර තිබුණ අතර, ක්‍රමවත් සැලැස්මක් හෝ එළඹුණු ගිවිසුමකින් තොරව ඉඩම පවරා ගැනීමට උත්සාහ කිරීම මෙයට හේතු වී තිබුණි.

(ii) බස්නාහිර පළාත් සභාවට ගෙවන ලද රු. මිලියන 24 ගිණුම්වල ජංගම වත්කම් හා ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී වෙළඳ හා වෙනත් අත්තිකාරම් යටතේ පෙන්වා ඇති ශේෂය තුළ රු. 1,070,154 ක ශේෂයක් වර්ෂ පහකට අධික කාලයක් තුළ අයකිරීමට ක්‍රියා නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි.

3.4 *කොන්ත්‍රාත් පරිපාලනය*

බාහිර කොන්ත්‍රාත්කරුවන් වෙත පිරිනමා තිබූ කොන්ත්‍රාත්වල ගිවිසුම් ගත එකඟ වූ දිනට එම කොන්ත්‍රාත්තු නිම නොකිරීම පොදු ලක්ෂණයක් වී තිබුණි. කොන්ත්‍රාත්වල කාලය දීර්ඝ කිරීම සඳහා පාදක කරගෙන තිබුණු කරුණු ප්‍රමාණාත්මක නොවූ අතර, බොහොමයක් කරුණු ආයතනයේ දුර්වලතා හේතුවෙන් සිදුවූ ප්‍රමාදවීම් බව නිරීක්ෂණය විය.

3.5 *නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්*

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශිෂ්‍යයන් 300 කට නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීමට රු. මිලියන 1.6 ක් වැයකර මිලදී ගෙන තිබූ පර්චස් 41.3 ඉඩම කිසිඳු කාර්යයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා යොදාගෙන නොතිබුණි.

(ආ) අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් මූලධන අත්තිකාරම් ලෙස 2001 වර්ෂයේදී රු. 940,188 ක් වැයකර ඇතත් 2006 වර්ෂය අවසානයේදීවත් එම කාර්යය ඉටුකර නොතිබුණු අතර, උපදේශන ගාස්තු ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රු. 2,070,000 ක් සමාලෝචිත වර්ෂයේ දී ද ගෙවා තිබුණි.

3.6 *අවිධිමත් ගනුදෙනු*

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි xii කොටසෙහි ඇතුළත් 99 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයට කුමන ප්‍රභවයකින් හෝ ලැබෙන මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැරවිය යුතු වුවත්, මෙම නියෝගය අභිබවා විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත 1995 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන අයුරින් උපකුලපති අරමුදල නමින් අරමුදලක් පිහිටුවා විවිධ පුද්ගලයන්ගේ සුභසාධනය වෙනුවෙන් වියදම් දරා තිබුණි. 2006 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු. 1,237,614 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දී එසේ දරා ඇති වියදම රු. 338,566 ක් විය.

(ආ) සීඩා සරෙක් වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති දෙකක විශ්‍රාමික මහාචාර්‍යවරයෙකුගේ හා කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ නියුතු මහාචාර්යවරියකුගේ විදේශ සංචාර සඳහා රු. 595,848 ක් පාලක සභා තීරණය මත විශ්වවිද්‍යාල අරමුදලෙන් වැයකර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ වැසි ජලය බැසයාම සඳහා කාණු පද්ධතියක් සකස් කිරීමට ගිවිසුමකින් තොරව ප්‍රාදේශීය සභාව වෙත 1999 පෙබරවාරි 17 දින රු. 1,310,000 ක මුදලක් ගෙවා වර්ෂ 8 ක් ගතවී ඇතත් එම කාර්යය ඉටු කරවා ගැනීම හෝ රජයේ මුදල් ආපසු ලබාගැනීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.

3.7 *මතභේදයට තුඩුදෙන කරුණු*

විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකුට වෙනත් ආයතනයක අධ්‍යක්ෂ ධුරයක සේවය කරමින් සිටියදී වැටුප් හා දීමනා වශයෙන් රු. 70,344 ක් ගෙවා තිබිණි. තවත් ආචාර්යවරයෙකුට විශ්වවිද්‍යාලයේ සේවයේ යෙදී නොසිටි මාස 3 ක කාලයක් සඳහා රු. 170,310 ක් ද විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.

3.8 *වාර්ෂික වාර්තා*

සමාලෝචිත වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) බාහිර පාඨමාලා
(ඇ) ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම්
(ඈ) ඉදිකිරීම්
(ඉ) විභාග කටයුතු
(ඊ) සේවයෙන් මුදා හැරීම්
(උ) පාලන ගිණුම්

පී. ඒ. පේමතිලක,
විගණකාධිපති.

08-272

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සෙලාන් බැංකුව පීඑල්සී - යාපනය

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකීව් 9 යටතේ ලියා පදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංකය : 0850 -01107344 - 001 සහ 0850 -01536101-001

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 අප්‍රේල් 04 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකීව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී.) ප්‍රසිද්ධ නොතාරිස් වී. ටී. සිවලිංගම් විසින් සහතික කරන ලද 2004 ජූලි 21 දිනැති අංක 382 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම යාපනය පදිංචි කුණරත්නම් සෙල්වරාසා සහ සුගණියා සෙල්වරාසා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි පනස්ලක්ෂ හැත්තෑතුන්දහස් තිස් හතරයි ශත අනූහයක (රු.1,50,73,034.96) මුදලක් 2007 මැයි 31 වෙනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,50,73,034.96 මුදලද, 2007 ජූනි 1 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක : 382 බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

උතුරු පාලතේ, යාපනය දිස්ත්‍රික්කයේ සහ කොට්ඨාසයේ වුන්ඩිකුලි දේවස්ථානයට අයිති පෙදෙසෙහි කරෙයියූර් සහ වුන්ඩිකුලි පිහිටි විරපතිරායන්පුලම් නමැති ප්‍රමාණයෙන් 10 කේ එම්එස් විසී සහ 8 කේඑල්එස් යුතු ඩී 155/197 හි ලියාපදිංචි ඉඩම, මෙයින් බස්නාහිර පැත්තෙන් බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු පී. ඒ. සේනාතිරාජා විසින් සාදන ලද 1966.03.18 දිනැති අංක 192 දරන සැලැස්මේ ලොට් 3 ලෙස පෙන්නුම් කරනු ලබන ප්‍රමාණයෙන් 4එල්එම්එස්වීසී සහ 07 කේඑල්එස් බෙදන ලද කොටසට මායිම් : නැගෙනහිරට : ඩොනීට අයිති එකී සැලැස්මේ සඳහන් ලොට් 1 සහ එකී සැලැස්මේ සඳහන් ලොට් 2, උතුරට : ලංකා ආණ්ඩුවේ දුම්රිය පාර ද, බස්නාහිරට : ජේ. එච්. ආර්. පෙරිම්පනායගම් මයාට සහ එස්. රාජසේකරන් මියට අයිති දේපළ සහ දකුණට : වික්ටර් බාර්ට්ලට් ගේ දේපළ, එකී සැලැස්මේ ලොට් 2 ලෙස පෙන්නුම් කරනු ලබන මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය සහ මෙහි තුල සියලු අයිතිවාසිකම් සමග ඉඩම.

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ කරෙයියූර් පිහිටි වීරපතිරායන්පුලම් නමැති ඉඩමේ යාපනය අසිර්වාදම් පාර වරිපනම් අංක 33 දරන ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල එහි පිහිටි ගොඩනැගිලි සමග සහ එයට මායිම : උතුරට : ලංකා ආණ්ඩුවේ දුම්රිය මාර්ගය, නැගෙනහිරට : ඩී. ඇම්. වොල්ටන් මියට අයිති දේපළ සහ පාර, දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : ලොට් 3 ද යන මායිම් තුල බලයලත් මිනින්දෝරු පී. ඒ. සේනාතිරාජා විසින් සාදන ලද 1966 මාර්තු 18 දිනැති අංක 192 දරන සැලැස්ම අනුව ප්‍රමාණයෙන් 5එම්එල්එම්එස් විසී සහ 10කේඑල්එස් යුතු ඉඩම.

පෙරකී කරෙයියූර් පිහිටි එකී අංක 192 දරන සැලැස්ම අනුව වීරාපතිරායන්පුලම් නමැති ඉඩමේ ලොට් 2 (අඩි 12 ක් පළල පාර සඳහා වෙන් කිරීමක් වන) ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම් : උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : වික්ටර් බාර්ට්ලට් ගේ දේපළ සහ බස්නාහිරට : ලොට් 3 ද යන මායිම් තුල දැන් අංක : 0447 දරන සැලැස්මෙන් ආවරණය වන ප්‍රමාණයෙන් 9කේඑල්එස්වීසී වන සම්පූර්ණ ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යධිකාරී - නීති

08-399/2

### මහජන බැංකුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වන වගන්තිය යටතේ සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

2008.02.29 වන දින පවත්වන්නට යෙදුනු මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, පහත දැක්වෙන යෝජනාව, 1986 අංක 32 දරන පනතින් සංශෝධන පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වන වගන්තිය යටතේ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව නමට, නුවරඑළිය මහජන නොතාරිස් ජයමිණි අඹගහවත්ත විසින් ලියා සහතික කරන ලද අංක 574 හා 2007 මාර්තු 12 වන දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ජාගොඩ ආරච්චිගේ ජේමත් සහ සිසික සුලෝචන සම්පත් ජාගොඩ ආරච්චි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කර මත දැනට රුපියල් නවලක්ෂ හැටඑක් දහස් නවසිය හතලිස් දෙකකුත් ශත අසූහතරක (රු. 961,942.84) මුදලක් මහජන බැංකුවට ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් නවලක්ෂ හැටඑක් දහස් නවසිය හතලිස් දෙකකුත් ශත අසූහතරක (රු. 961,942.84) මුදලද 2007.09.25 දින සිට විකිණීමේ දින දක්වා කාලයට එම මුදල සඳහා වර්ෂයකට සියයට 39% බැගින් පොළියද යන මේ මුදල් ප්‍රමාණ අතරින් යම් මුදලක් මේ වන විට ගෙවා ඇත්නම්, ඒ මුදල අඩුකොට ඉහත සඳහන් මුදල් ප්‍රමාණ සහ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද සමග අයකර ගැනීම සඳහා, එකී අංක 574 දරන උකස් බැඳුම්කරය මගින් එම බැංකුව වෙත උකස් කර තිබෙන දේපළ හා පරිශ්‍රය, කොළඹ, හැව්ලොක් පාර, අංක 290 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### උකස් කරන ලද දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ, බ්ලැක්පූල් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වින්ඩ්කෝනර් යන ස්ථානයේ පිහිටි බෙදා වෙන් කළ බිම් කට්ටියක් වන අංක 980 දරන පිඹුරේ ලොට් අංක 13 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : පාර ද,නැගෙනහිරට : පාරක් සඳහා වෙන් කළ බිම ද දකුණට සහ බස්නාහිරටඃ මෙම ඉඩමේ ඉතිරි කොටසද, යන මායිම් ඇතුළත රූඩ් එකක් (අ. 0, රූ.1 ප. 0) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ NUA 41/2517/96 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
නුවරඑළිය.

මහජන බැංකුව
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංකඃ 40, උද්‍යාන පාර,
නුවරඑළිය.

08-362

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරණ බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංක : 1049 5002 6154.

2007 අගෝස්තු මස 30 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දැරණියගල සමන් දේවාල පාරේ අංක 1 දරණ ස්ථානයේ පදිංචි තෝල්කමුදලිගේ දොන් තිළින ධනන්ජය රන්ගෙදර යන අය බන්ධන්දායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 මැයි 16 දාතම හා අංක 3269 දරන උකස් බැදුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබනලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 පෙබරවාරි මස 27 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය ලක්ෂ දොලොස් දහස් හාරසිය තිස් හයකුත් ශත විසි අටක (රු. 612,436.28 ක් පමණයි) මුදලක් එකී බැදුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් හය ලක්ෂ දොලොස් දහස් හාරසිය තිස් හයකුත් ශත විසි අටක (රු. 612,436.28 ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හාර ලක්ෂ අනූහත් දහස් හත්සිය අසූපහකුත් ශත අසූපහක (රු. 497,785.85 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දොලහයි දශම පහ (12.5%) බැගින් 2007 පෙබරවාරි මස 28 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අය කර ගැනීම සඳහා එකී අංක 3269 දරණ බැදුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උප ලේඛණයේ වඩාත් මැනවින් විස්තර කොට එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරණ බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අටලුගම් කෝරලේ නැගෙනහිර, දැරනියගල පිහිටි උයන්වත්ත සහ වලපල්ල නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. ආර්. එම්. ඩී. පණ්ඩිතරත්න විසින් සාදන ලද 2003 සැප්තැම්බර් 07 දාතම හා අංක 581 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කොට නිරූපිත අවිස්සාවේල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව Q 116/224 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 581 දරන පිඹුර ප්‍රකාර උතුරටඃ දේවාල පාර ද නැගෙනහිරඃ අංක 1458/P පිඹුරේ ලොට් අංක 04 ද දකුණට : ලොට් 02 ද සහ බටහිරට : ලොට් 02 ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තුනයි දශම හතරක් (අක්. 0, රූ. 1, පර්. 3.4) වන බෙදා

වෙන් කොට සීමානිර්නය කල සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල වගාවන් හා ගොඩනැගිලිද සමග සහ මතින් හා ඔස්සේ මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-400/5

---

**සීමාසහිත සම්පත් බැංකුව**

1990 අංක 04 දරණ බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංක : 1069 5000 9589.

2007 අගෝස්තු මස 30 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝමාගම, අතුරුගිරිය පාරේ, ගැමුණු මාවත අංක 825/3 දරණ ස්ථානයේ පදිංචි දන්දෙණිය ගමගේ සමන් කුමාර යන අය බන්ධන්දායි වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රම්‍යා අලහේන්ද්‍ර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 ජනවාරි 24 දාතම හා අංක 1291 දරණ උකස් බැදුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබනලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 ජූනි මස 05 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාර ලක්ෂ දාහතර දහස් පහලොවකුත් ශත දහඅටක් (රු. 4,14,015.18 ක් පමණයි) එකී බැදුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් හාර ලක්ෂ දාහතර දහස් පහලොවකුත් ශත අහඅටක් (රු. 4,14,015.18) ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හාර ලක්ෂ හාරදහස් හයසිය විසි නවයකුත් ශත තිස්තුනක (රු. 4,04,629.33 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහසය (16%) බැගින් 2005 අප්‍රේල් මස 27 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අය කර ගැනීම සඳහා එකී අංක 1291 දරණ බැදුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උප ලේඛණයේ වඩාත් මැනවින් විස්තර කොට එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

**උපලේඛණය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලෙපත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත හෝමාගම පිහිටි උඩහවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 2005 අප්‍රේල් 27 දාතම හා අංක 4968 දරණ පිඹුරේ ලොට් C ලෙස ලකුණු කොට නිරූපිත හෝමාගම ඉඩම් කාර්යාලයේ G 1322/253 හි ලියාපදිංචි කර ඇති එකී අංක 4968 පිඹුරට අනුව උතුරට : ඊ. වන්නිආරච්චි අයිතිය කියන ඉඩම ද, නැගෙනහිරඃ ලොට් A සහ ලොට් B ද, දකුණට : ජගත් අරුණ හා ටී. දිල්රුක්ෂික අයිතිය කියන ඉඩමද සහ බටහිරට : ජගත් අනුර සහ ඒ සතරසිංහ අයිතිය කියන ඉඩමද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් පහලොවයි දශම හයයි දෙකක් (අක්. 0, රූඩ්. 0, පර්. 15.62) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කල සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ වගාවන් හා ගොඩනැගිලිද සමග සහ මතින් හා ඔස්සේ මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-400/6

---

**සීමාසහිත සම්පත් බැංකුව පීඑල්සී**

1990 අංක 04 දරණ බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0042 5000 4201.

2007 මැයි මස 24 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමෙකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කැළණිය පට්ටිය හන්දිය දුටුගැමුණු මාවත අංක 362 හි පදිංචි අතුල පද්මසිරි වීරසිංහ යන අය බන්ධන්දායි වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2003 ජූලි 21 දාතම හා අංක 956 සහ 2005 අගෝස්තු 02 දාතම හා අංක 3399 දරන උකස් බැදුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 මාර්තු මස 14 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය ලක්ෂ විසිතුන් දහස් හැට අටකුන් ශත පනහක් (රු. 6,23,068.50 ක් පමණයි) එකී බැදුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් හයලක්ෂ විසිතුන් දහස් හැට අටකුත් ශත පනහක් (රු. 6,23,068.50 ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් පන් ලක්ෂ හැත්තෑපන් දහසක (රු. 5,75,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට පහලොව (15%) බැගින් 2007 මාර්තු මස 15 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අය කර ගැනීම සඳහා එකී අංක 956 සහ 3399 දරන බැදුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උප ලේඛණයේ වඩාත් මැනවින් විස්තර කොට එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරණ බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ පැලියගොඩ නගර සභා සීමාව ඇතුලත පැලියගොඩ පිහිටි ඉදිකැටියමුල්ලෙ කුඹුර නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1990 ජූලි 02 දාතම හා අංක 11535 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 912/185 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 11535 දරන පිඹුරට අනුව ඊසානදෙසින් : දුටුගැමුණු මාවත ද, ගිනිකොනදෙසින් : දුටුගැමුණු මාවතේ වරිපනම් අංක 364 B දරන එම ඉඩමේම කොටසක්ද නිරිතදිගින් : නා. සං. අධිකාරියේ ඉඩම වෙන් කරන අගල ද සහ වයඹ දෙසින් : දුටුගැමුණු මාවතේ වරිපනම් අංක 360A දරන එම ඉඩමේම කොටසක් ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම අටයි එකක් (අක්. 0, රූ. 0, පර්. 10.81) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල වගාවන් හා ගොඩනැගිලි ද සමග සහ මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-400/9

---

## මහජන බැංකුව - මරදගහමුල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2005.08.01 දිනැති අංක 10304 දරන උකස්කරය, 2004.06.22 දිනැති අංක 9295 දරන උකස්කරය හා 2001.12.19 දිනැති අංක 6595 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, පතිරගේ තිලක්සිරි සහ අලුත්ගමගේ බේබිනෝනා යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ තිස් පන්දහස් හත්සිය දහ නවයයි ශත නවය (රු. 2,35,719.09) රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) සහ රුපියල් දහතුන් ලක්ෂ හැත්තෑ හය දහස් පන්සියය (රු. 13,76,500) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.10.04 දින සිට වර්ෂයකට 27% බැගින් රුපියල් දෙලක්ෂ තිස් පන් දහස් හත්සිය දහ නවයයි ශත නවයක (රු. 2,35,719.09) මුදලට, 2006.09.01 දින සිට වර්ෂයකට 19.25% බැගින් රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) මුදලට සහ 2006.03.28 දින සිට වර්ෂයකට 19.25% බැගින් රුපියල් දහතුන් ලක්ෂ හැත්තෑ හය දහස් පන්සියයක (රු. 13,76,500) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ තිස් පන්දහස් හත්සිය දහ නවයයි ශත නවයයි (රු. 2,35,719.09) රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) සහ රුපියල් දහතුන් ලක්ෂ හැත්තෑ හය දහස් පන්සියයක (රු. 13,76,500) මුදල් අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 6595 අංක 9295 සහ අංක 10304 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.".

### දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කැලැපිටිමුල්ල ග්‍රාමයේ පිහිටි, මාවතබඩලන්ද නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. විතාරණ විසින් 1993.11.10 වන දින මැන සකස් කළ අංක 1970 දරන පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට: ලොට් 3, 4, 5, 6 සහ 11ද, නැගෙනහිරට: ප්‍රධාන මාර්ගය ද, (හේන්පිටගෙදර පාර), දකුණට: දැනට පී. තිලකසිරි හිමිකම් කියන මෙම ඉඩමේ කැබලි අංක 13 ද, බස්නාහිරට: පීටර්ට අයත්ව තිබී දැනට සියනේරිස් මුදලාලිගේ සහ පී. තිලකසිරිගේ උරුමකරුවන් හිමිකම් කියන ඉඩම ද යන මායිම් තුල පිහිටි පර්චස් දහ හතරයි දශම දෙකයි තුනක් (අ. 0, රූ. 0, පර්. 14.23) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 926/122හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, දූනගහ පත්තුවේ, කැලැපිටිමුල්ල ග්‍රාමයේ මාවතබඩලන්ද නැමැති ඉඩමට බලයලත් මානක, එච්. ඩී. රූපසිංහ විසින් 1973.06.04 දින මැන සකස් කළ අංක 81/1973 දරන පිඹුරේ ලොට් අංක 13 සහ 14 දරන කොටසට මායිම්, උතුරට : ලොට් අංක 12 ද, නැගෙනහිරට : මාර්ගය ද, දකුණට : ලොට් අංක 15ද, බස්නාහිරට : පීටර්ට අයිති ඉඩමද, යන මායිම් තුල පිහිටි පර්චස් තිස් දෙකයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 32.25) වඩාත් නිවැරදි ලෙස පර්චස් තිස් එකයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 31.75) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 910/73 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-363

---

## මහජන බැංකුව - මොරටුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් 2008.06.27 වන දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කුමුදිනී සුජාතා ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද 2006.09.29 දිනැති අංක 6748 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම, තෙල්ගේ ගාමිණී පීරිස් මහතා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ විසිනවදහස් අටසිය පනස්දෙකයි ශත විසිදෙකක් (රු. 4,29,852.22) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.04.04 දින සිට වර්ෂයකට සියයට විස්සයි දශම පහ බැගින් (20.5%) හා රුපියල් හාරලක්ෂ විසිනවදහස් අටසිය පනස්දෙකයි ශත විසිදෙකක් (රු. 4,29,852.22) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ "29" වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ විසිනවදහස් අටසිය පනස්දෙකයි ශත විසිදෙකක් (රු. 4,29,852.22) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 6748 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.".

### දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ මොරටුව නගර සභා සීමාව තුල, කටුකුරුන්ද, ජෝෂප් පෙදෙසේ, වරිපනම් අංක 50/4 දරන ස්ථානයේ පිහිටි "මාදන්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ශ්‍රේෂන් එස්. පෙරේරා මහතා විසින් 1989.11.29 දින මැන සාදන ලද අංක 3231 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද ලොට් අංක A දරන කොටසට මායිම්, උතුරට : එකී ඉඩමේම ලොට් අංක B දරන කොටස ද, නැගෙනහිරට : ජිනදාස කුරේට සහ එස්. කරලැයින් ෆොන්සේකාට අයත් ඉඩම ද, දකුණට : ලයනල් පීරිස් සහ ඇල්බට් යන අයට සහ ඩබ්. ෂෙල්ටන් ප්‍රනාන්දුට අයත් ඉඩම ද, බස්නාහිරට : මොරටුව සිට පානදුරට යන අලුත් පාර ද, යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් විසිනවයයි දශම හතයි අටක් (අක්. 0, රූඩ් 0, පර්. 29.78) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේත් ය.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 1847/38 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප II).

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ (පිටත),
මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

08-364

### මහජන බැංකුව - මහරගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.06.27 වන දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

"එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය සහ චන්ද්‍රිමා ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද 2005.03.03 දිනැති අංක 5561 සහ 2005.09.15 දිනැති අංක 2193 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම, ඕවිටිගල හේවාගේ දෝන විමලාවතී, හෙට්ටිආරච්චිගේ කැළුම් හරිතප්‍රිය, හෙට්ටිආරච්චිගේ බුද්ධික ලසන්ත, යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දහහත්ලක්ෂ තිස්දෙදහස් තුන්සිය එකොළහයි ශත දොළහක් (රු. 17,32,311.12) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2008.02.09 දින සිට වර්ෂයකට සියයට දහනවයයි දශම පහ බැගින් (19.5%) හා රුපියල් හත්ලක්‍ෂ හැත්තෑපන් දහසක් (රු. 7,75,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.02.29 දින සිට වර්ෂයකට සියයට දහසයයි දශම පහ බැගින් (16.5%) හා රුපියල් විසිලක්ෂයක (රු. 20,00,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2008.05.01 දින සිට වර්ෂයකට සියයට දහසයයි දශම පහ බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ "29එල්" (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දහහත්ලක්ෂ තිස්දෙදහස් තුන්සිය එකොළහයි ශත දොළහක් (රු. 17,32,311.12) හා රුපියල් හත්ලක්ෂ හැත්තෑපන්දහසක් (රු. 7,75,000) හා රුපියල් විසිලක්ෂයක (රු. 20,00,000) මුදලක් අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 5561 සහ අංක 2193 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාව තුල, උඩහමුල්ල යන ගම පිහිටි "කැකුණගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. අහංගම මහතා විසින් 1981.08.01 වැනි දින මැන සාදන ලද අංක 2691 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කල ලොට් A5 A දරන කොටසට මායිම්, උතුරු නැගෙනහිරට : මිරිහාන - උඩහමුල්ල පාර ද, දකුණු-නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් B ද, දකුණු-බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් A 3 ද, උතුරු-බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් A4 ද, යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් දහහතරක් (අ. 0, රූ. 0, පර්. 14) විශාල ඉඩම සහ එහි තුල පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩමට නැවත කළ මැනීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ පළාත් ආණ්ඩු සභා සීමාව තුල, අංක 10 දරන කොට්ඨාසයට අයත් උඩහමුල්ල යන ගම පරණ කොට්ටාව පාරේ පිහිටි "කැකුණගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඇම්. බී. ද සිල්වා

මහතා විසින් 1946.05.10 වන දින මැන සාදන ලද අංක 6145 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කල ලොට් A5 දරන කොටසට මායිම් උතුරු-නැගෙනහිරට : මහ පාර ද, දකුණු නැගෙනහිරට : මෙම ඉඩමේම B අක්ෂරය දරන බිම් කොටස ද, දකුණු බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් B3 දරන බිම් කොටස ද, උතුරු බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් A4 දරන බිම් කොටස ද, යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් දහහතරක් (අ. 0, රූ. 0, පර්. 14) විශාල ඉඩම සහ එහි තුල පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2033/276 යටතේ ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප II).

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ (පිටත),
මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

08-365

---

**සම්පත් බැංකුව පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සම්පත් බැංකුවේ පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0002 5004 0342.

2005 අප්‍රේල් මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සීදුව, අමන්දොළුව, අංක 100හි බද්ධකරණ සත්තම්බිගේ අජිත් ලාලන යන අය බන්ධනදායී වශයෙන්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වී. ඊ. විජේරත්න විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ පිළිවෙලින් 1994 අප්‍රේල් මස 07 දාතම හා අංක 825, 1995 ජූලි මස 28 දාතම හා අංක 1106 සහ 1999 අප්‍රේල් 08 දාතම හා අංක 2045 දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එල්. එස්. සේනාරත්න විසින් සහතික කළ 2000 ඔක්තෝබර් 30 දාතම හා අංක 283 දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වී. ඊ. විජේරත්න විසින් සහතික කළ 1995 නොවැම්බර් මස 08 දාතම හා අංක 1189 දරන උකස් බැඳුම්කර මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2005 පෙබරවාරි මස 16 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හතලිස් හත්ලක්ෂ අසූඑක්දහස් අටසිය තිස්හයයි ශත පහක (රු. 47,81,836.05) මුදලක් එකී බැඳුම්කර මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින්. එකී රුපියල් හතලිස් හත්ලක්ෂ අසූඑක් දහස් අටසිය තිස්හයයි ශත පහක (රු. 47,81,836.05) සම්පූර්ණ හිග මුදල සමග රුපියල් විසිහත් ලක්ෂ අනූදහස් විසිතුනයි ශත තිස් දෙකක (රු. 27,90,023.32) මුදල සඳහා වසරකට සියයට විසිදෙක (22%) බැගින් 2005 පෙබරවාරි මස 17 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 825, 1106, 2045, 283 සහ 1189 දරන බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.".

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටුනායක-සීදුව නගර සභා සීමාව සහ කටුනායක මහ කොළඹ ආ. කො. ස. සීමාව ඇතුළත, අමන්දොලුවේ පිහිටි බේස්ලයින් පාරේ, වරිනම් අංක 260/25 සහ 260/26 දරන "කීන්ගහවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ආර්. ඇම්. ජේ. රණසිංහ විසින් සාදන ලද අංක 498 දරන පිඹුරේ ලොට් 18 සහ 19 වශයෙන් ලකුණු කොට ඇති , උතුරට අංක 498 පිඹුරේ ලොට් 12 ද, නැගෙනහිරට : අංක 498 පිඹුරේ ලොට් 13 ද, දකුණට : ලොට් අංක 14, 17 සහ ලිලී පෙරේරාගේ ඉඩම ද සහ බටහිරට ලොට් 20 ද මායිම් වන, මීගමුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව C842/146හි ලියාපදිංචි කර ඇති ප්‍රමාණයෙන් පර්චස් විසිඅටයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 28.6) වන ප්‍රත්‍යාසන්න බිම් කොටස් දෙක ඒවායේ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේ සමග සහ පහත සඳහන් බිම් කොටස් මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද හා සමග ය.

ඉහත කී අමන්දොලුවේ පිහිටි කීන්ගහවත්ත නමැති ඉඩමේ එකී අංක 498 පිඹුරේ නිරූපිත ලොට් 12 වශයෙන් (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන්කළ කොටස) ලකුණු කොට දක්වා ඇති, මීගමුව ඉඩම් කාර්යාලයේ C812/227හි ලියාපදිංචි කොට ඇති එකී අංක 498 පිඹුරට අනුව උතුරට : ලොට් 1 සිට 5, ලොට් 11, 10 සහ 9 ද, නැගෙනහිරට ලොට් 9, 26 සහ 29 ද, දකුණට ලොට් 29, 13 සහ ලොට් 18, 23 ද සහ බටහිරට : බේස්ලයින් පාරද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තිස්තුනක් (අ. 0, රූ. 0, පර්. 33) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටසය.

ඉහත කී අමන්දොලුවේ පිහිටි කීන්ගහවත්ත නමැති ඉඩමේ එකී අංක 498 පිඹුරේ නිරූපිත ලොට් 14 වශයෙන් (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන්කළ කොටස) ලකුණු කොට දක්වා ඇති, මීගමුව ඉඩම් කාර්යාලයේ C812/228හි ලියාපදිංචි කොට ඇති එකී අංක 498 පිඹුරට අනුව උතුරට : ලොට් 18 සිට 13 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 15 ද, බටහිරට : ලොට් 17 ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තුනක් (අ. 0, රූ. 0, පර්. 3) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ය.

ඉහත කී අමන්දොලුවේ පිහිටි කීන්ගහවත්ත නමැති ඉඩමේ එකී අංක 498 පිඹුරේ නිරූපිත ලොට් 29 වශයෙන් (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන්කළ කොටස) ලකුණු කොට දක්වා ඇති, මීගමුව ඉඩම් කාර්යාලයේ C842/147හි ලියාපදිංචි කොට ඇති උතුරට : ලොට් 12, ද, නැගෙනහිරට : ලොට් 26 ද, දකුණට : පාර ද සහ බටහිරට : ලොට් 13 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 3.6) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ය.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටුනායක- සීදූව නගර සභා සීමාව සහ කටුනායක මහ කොළඹ ආ. කො. ස. සීමාව ඇතුළත, අමන්දොලුවේ පිහිටි බේස්ලයින් පාරේ වරිපනම් අංක 206/22 23 සහ 24 දරන "කීනගහවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ආර්. ඇම්. ජේ. රණසිංහ විසින් සාදන ලද 1994 ජූනි මස 06 දාතම හා අංක 914 දරන පිඹුරේ නිරූපිත ලොට් 15ඒ ලකුණු කොට ඇති උතුරට : ලොට් 14 ද, නැගෙනහිරට : අංක 498 පිඹුරේ ලොට් 29 ද. දකුණට : ලොට් අංක 15බී ද සහ බටහිරට : ලොට් 17 ද මායිම් වන, මීගමුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රුරුව 722/254හි ලියාපදිංචි කර ඇති ප්‍රමාණයෙන් පර්චස් එකොලහක් (අ. 0, රූ. 0, පර්. 11) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේ සමගය

ඉහත කී අමන්දොලුවේ පිහිටි කීනගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ආර්. එම්. ජේ. රණසිංහ විසින් සාදන ලද 1991 මැයින මස 08 දාතම හා අංක 498 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 වශයෙන් ලකුණු කොට ඇති, මීගමුව ඉඩම් කාර්යාලයේ සී722/249හි ලියාපදිංචි කොට ඇති උතුරට : ලොට් 12 ද, නැගෙනහිරට : ලොට් 29 (පාරට වෙන් කළ කොටස) ද, දකුණට ලොට් 14 ද, සහ බටහිරට ලොට් 18 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් පහළොවක (අ. 0. රූ. 0, පර්. 15) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ය.

ඉහත කී අමන්දොලුවේ පිහිටි කීනගහවත්ත නමැති ඉඩමේ අංක 498 දරන පිඹුරේ නිරූපිත ලොට් 14 වශයෙන් ලකුණු කොට ඇති මීගමුව ඉඩම් කාර්යාලයේ සී722/233 හි ලියාපදිංචි කොට ඇති, උතුරට : ලොට් 18 සහ 13 ද, නැගෙනහිරට : ලොට් පාර ද, දකුණට : ලොට් 15 ද සහ බටහිරට : ලොට් 17ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තුනක් (අ. 0, රූ. 0, පර්. 3) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ය.

ඉහත කී ලොට් 13 සහ 14 දැන් නැවත මැන අංක 914 පිඹුරට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

ඉහත කී අමන්දොලුවේ පිහිටි බේස්ලයින් පාරේ වරිපනම් අංක 260/22, 23, 24 දරන කීනගහවත්ත නමැති ඉඩමේ එකී අංක 914 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 වශයෙන් ලකුණු කොට ඇති, උතුරට ලොට් 12 ද, නැගෙනහිරට : ලොට් 29 (පාරට වෙන් කළ කොටස) ද, දකුණට : ලොට් 14 ද සහ බටහිරට : ලොට් 18 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කල බිම් කොටස ය.

ඉහත කී අමන්දොලුවේ පිහිටි බේස්ලයින් පාරේ, වරිපනම් අංක 206/22, 23, 24 දරන කීනගහවත්ත නමැති ඉඩමේ එකී අංක 914 දරන පිඹුරේ නිරූපිත ලොට් 14 වශයෙන් ලකුණු කොට ඇති උතුරට : අංක 498 පිඹුරේ ලොට් 18 සහ ලොට් 13 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 15A ද, සහ බටහිරට : අංක 498 පිඹුරේ ලොට් 18 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තුනක් (අ. 0, රූ. 0, පර්. 3) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටසය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-401/7

**සෙලාන් බැංකුව පීඑල්සී - ත්‍රිකුණාමලය ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0880-90989-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.06.09 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. කේ. මාම්පිටිය විසින් දෙකම සහතික කරන ලද 2005 අගෝස්තු මස 17 වැනි දිනැති අංක 1489 සහ 2005 නොවැම්බර් මස 14 දිනැති අංක 1558 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, ත්‍රිකුණාමලය පදිංචි අමරසිංහ ආරච්චිගේ දයානන්ද යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි හැට හත්ලක්ෂ අනූඑක් දහස් පන්සිය අසූනවයයි ශත අසූ අටක (රු. 1,67,91,589.88) මුදලක් 2007 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් 1,67,91,589.88 මුදල ද, 2009 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1489 සහ 1558 බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාශයේ නගරය සහ ත්‍රිකුණාමල කඩවත් හි ප්‍රාදේශීය සභා සීමාව තුළ කවඩිකුඩා ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. සෙල්ලපිල්ලේයි විසින් සාදන ලද 2004.11.30 දිනැති අංක 4054 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන තෙකිලත්තුනාඩු නමැති ඉඩමේ කැබලි අංක 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ත්‍රිකුණාමලය-මහනුවර පාර ද, නැගෙනහිරට : රොසලින් නෝනා විසින් හිමිකම් කියනුන ලබන එල්. ඩී. ඕ. ඉඩම ද. දකුණට : රජයේ ඉඩම ද, සහ බස්නාහිරට : ගයාත් උල්ලස්හේවගේ විසින් හිමිකම් කියනු ලබන එල්. ඩී. ඕ. ඉඩම යන මායිම් තුළ එකී අංක 4054 දරන සැලැස්ම අනුව රූඩ්

එකයි පර්චස් හයක් (අ. 0, රූ. 1, පර්. 6) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ත්‍රිකුණාමල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ හිමිකම් එල්ඩී/ටීපී/26/118 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

08-397/2

---

**සෙලාන් බැංකුව පීඑල්සී - අම්බලන්ගොඩ ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0240-02513140-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.05.26 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යොමු පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩී. අයි. එන්. තිලකරත්න විසින් සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 13 වැනි දිනැති අංක 5 බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුරෙහි 1995.07.27 දිනැති අංක එන් (පීවීඑස්) 15449 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංස්ථාපිත සමාගමක් වන දේශානි ඩ්‍රස්පොයින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කළුතර පදිංචි එදිරිමුනි නන්දන ශාන්ත ශ්‍රී රූදිගු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි පනස්හය ලක්ෂ පනස්එක් දහස් තුන්සිය පහළොවයි ශත හතක (රු. 1,56,51,315.07) මුදලක් 2007 මැයි මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,56,51,315.07 මුදල ද, 2007 ජුනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 05 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාව තුළ මාලඹේ කහන්තොට පාරෙන් ඔබ්බෙහි පිහිටි බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1993.11.08 දිනැති අංක 1261 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් එමරල් ක්‍රසන්ට් යනුවෙන් හඳුන්වනු ලබන හෝම්ලේ රබර් එස්ටේට් නමැති ගස්, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් අංක 15 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් අංක 31 සහ 27 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, නැගෙනහිරට : ලොට් අංක 2 ද, දකුණට : ලොට් අංක 23 සහ 16 සහ බස්නාහිරට : ලොට් අංක 14 ද යන මායිම් තුළ එකී අංක 1261 දරන සැලැස්ම අනුව පර්චස් දහයයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 10.1) නොහොත් හෙක්ටයාර් .0255ක් විශාල ඉඩම. මෙය හෝමාගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ හිමිකම් ජී 915/263 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත දැක්වෙන මාර්ගය සඳහා වෙන්කල ඉඩම තුළ යටින්, දිගේ සහ උඩින් ගමන් කිරීමට සහ බර පැටවූ හෝ නොපැටවූ රථවාහන යන දෙකටම යාමට සහ ඊමට සහ ප්‍රතික්‍රමනයවීමට අවකාශ සහ විදුලි කේබල් සහ දුරකථන කේබල් ඇදීමට හෝ කණු සිටවීමට, උඩ විදුලි රැහැන් ඇදීමට, ජලනල ජලබස්නා ක්‍රම සහ ජලාපවහන පද්ධතිය සැකසීමේ පූර්ණ නිදහස සහ බලය සමග.

පෙර කී මාලබේ පිහිටි එකී අංක 1261 දරන මිණුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හෝම්ලේ රබර් එස්ටේට් නමැති ඉඩමේ ලොට් අංක 27 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට, මායිම්, උතුරට : පාර සඳහා වෙන් කිරිම ද, නැගෙනහිටරට : ලොට් අංක 19. 21 සහ 22 ද, දකුණට : ලොට් අංක 15 සහ බස්නාහිරට : ලොට් අංක 11 සහ 10 යන මායිම් තුළ එකී අංක 1261 දරන සැලැස්ම අනුව පර්චස් හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 7.5) නොහොත් හෙක්ටයාර් 0.01897ක් විශාල ඉඩම. මෙය හෝමාගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ හිමිකම් පී 1634/194 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

08-397/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සම්පත් බැංකුවේ පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 1003 5043 7651.

2007 අප්‍රේල් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පිටකෝට්ටේ, කුරුඳුවත්ත පාරේ, අංක 62/1හි පදිංචි තනිප්පුලි ආරච්චිගේ බියංකා ජීවන්ති සහ පලාකෙටි පිටියගේ පියතිලක යන දෙදෙන බන්ධනදායින් වශයෙන් කොළඹ බලයලත් මිනින්දෝරු ඩී. ඩී. කේ. ගමලත් විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2004 නොවැම්බර් මස 05 දාතම හා අංක 553 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 පෙබරවාරි මස 20 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකොලොස් ලක්ෂ හතලිස් තුන්දහස් තුන්සිය දහසයකුත් ශත හැටපහක් (රු. 1,43,310.65)ක් බැඳුම්කර මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් එකොලොස් ලක්ෂ හතලිස් තුන් දහස තුන්සිය දහයකුත් ශත හැටපහක (රු. 1,43,316.65ක් ) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් එකොලොස් ලක්ෂ නවසිය හතලිස් දෙකකුත් ශත අසූතුනක (රු. 1,100,942.83ක්) මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් 2007 පෙබරවාරි මස 21 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද, සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී අංක 553 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරතොට ගමේ පිහිටි මැදවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2004 ජනවාරි මස 20 දාතම හා අංක 2469 දරන පිඹුරේ ලොට් 2සී2 වශයෙන් ලකුණු කොට නිරූපිත හෝමාගම ඉඩම් කාර්යාලයේ G1029/273හි ලියාපදිංචි කොට ඇති එකී අංක 2469 පිඹුරට අනුව උතුරට : අංක 2395 පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 2C ද, දකුණට : අංක 459 පිඹුරේ ලොට් 2 D 2, අංක 3429 පිඹුරේ ලොට් 2E සහ අංක 2469 පිඹුරේ ලොට් 2C3, (නමුත් අංක 3429 පිඹුරේ ලොට් 2 C 3 හා 2E සහ අංක 459 පිඹුරේ ලොට් 2 D 2 ලෙස ලියාපදිංචි කොට ඇති) ද, සහ බටහිරට : අංක 2469 පිඹුරේ ලොට් 2C3 සහ ලොට් 2C4 ද, මායිම්වන ප්‍රමාණයෙන් පර්චස් දාහතරක් (අ. 0. රූ. 0, පර්. 14) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කල සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාල සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්වද සමග

පහත දැක්වෙන ඉඩම් මතින් මාර්ග අයිතිය ද සමග ය.

1. හෝමාගම ඉඩම් කාර්යාලයේ G 1029/274හි ලියාපදිංචි කොට ඇති ඉහත කී අංක 2469 පිඹුරේ නිරූපිත ලොට් 2 C 3 (අඩි 12ක් පළල පාර)
2. හෝමාගම ඉඩම් කාර්යාලයේ G 1029/272 යටතේ ලියාපදිංචි කොට ඇති බලයලත් මිනින්දෝරු පී. පී. ඩයස් විසින් සාදන ලද 1998 මැයි 3 දාතම හා අංක 459 දරන පිඹුරේ නිරූපිත ලොට් 2D2 (අඩි 12ක් පළල පාර)
3. හෝමාගම ඉඩම් කාර්යාලයේ 1029/7 යටතේ ලියාපදිංචි කොට ඇති බලයලත් මිනින්දෝරු ඩී. එස්. එස්. කුරුප්පු විසින් සාදන ලද 1995 දෙසැම්බර් මස 29 දාතම හා අංක 3429 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 E (අඩි 12ක් පළල පාර)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-400/4

---

### සම්පත් බැංකුව පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0030 1000 0520.

2005 ජූනි මස 29 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලුනුවිල රාජපක්ෂ නිවස යන ස්ථානයේ "හවුස් ලැන්ඩ්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ පවත්වාගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන එකී ජනරජයේ ලුනුවිල රාජපක්ෂ නිවස හි පදිංචි කුරුප්පු අප්පුහාමිලාගේ උදය පද්ම කුමාර කුරුප්පු යන අය බන්ධනදායී වශයෙන්, වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 1998 නොවැම්බර් මස 01 දාතම හා අංක 14386 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2005 මැයි මස 09 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් නවලක්ෂ එකොලොස් දහස් හාරසිය අනූදෙකයි ශත දහනවයක් (රු. 9,11,492.19) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතු හෙයින්, එකී රුපියල් නවලක්ෂ එකොලොස් දහස් හාරසිය අනූදෙකයි ශත දහනවයක (රු. 9,11,492.19) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හත්ලක්ෂ විසිදහස් අටසිය හැට දෙකයි ශත හයක (රු. 7,20,862.06) මුදල සඳහා වසරකට සියයට දහනවය (19%) බැගින් 2005 මැයි මස 10 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 14386 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇත් දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුළත, දකුණු පිටිගල් කෝරළේ, ඕතර පළාතේ, ලුනුවිල පිහිටි කහටගහවත්ත සහ උණපදුරුවත්ත නමැති ඉඩමේ ලොට් 02 වශයෙන් හැඳින්වෙන, මාරවිල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව 65/79 හි

ලියාපදිංචි කොට ඇති, බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 1991 ඔක්තෝබර් මස 22 දාතම හා අංක 2025 පිඹුරේ නිරූපිත උතුරට : ගම් සභා පාර ද, නැගෙනහිරට : එච්. කරුණාරත්න ගේ හා ඩී. කුලසේකරගේ ඉඩම් ද, දකුණට : පාර ද, බටහිරට : එකී අංක 2025 පිඹුරේ ලොට් 01 ද මායිම් වන, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසිපහක් (අ. 1. රූ. 1, පර්. 25) වන එකී ලොට් 02 නැමැති බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි පිහිටි සෑම සියළු දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-400/8

---

**සම්පත් බැංකුව පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 1060 5311 2456.

2007 ඔක්තෝබර් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැබොඩ, කිරිල්ලවල, අංක 142/සී හි පදිංචි චමල් රෝයි විජේවර්ධන සහ වන්නිනායක මුදියන්සේලාගේ සවර්ණලතා කුමාරිහාමි යන දෙදෙන බන්ධන්දායීන් වශයෙන් සහ ඉහත කී වැබොඩ, කිරිල්ලවල අංක 142/සී හි එකී චමල් රෝයි විජේවර්ධන යන අය උකස්කරු වශයෙන් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. අයි. ආර්. වේරගොඩ විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කල 2006 ජූලි මස 03 දාතම හා අංක 203 දරන උකස් බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔවුන් වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 ජූලි මස 31 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකොලොස් ලක්ෂ හයදහස් නවසිය විසි හතකුත් ශත හතලිස් අටක (රු. 1,106,927.48ක් පමණයි) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින්, එකී රුපියල් එකොලොස් ලක්ෂ හයදහස් නවසිය විසිහතයි ශත හතලිස් අටක් (රු. 1,106,927.48ක් පමණයි) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් දසලක්ෂයක (රු. 1,000,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් 2007 අගෝස්තු මස 01 දින සිට වෙන්දේසි දින තෙක් තව දුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී අංක 203 දරන බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා (උප කාර්යාලය අංක 2 නාරංවල) සීමාව ඇතුළත, වැබොඩ පිහිටි "හොරගහහේන" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1987 මැයි 31 දාතම හා අංක 170 දරන පිඹුරේ ලොට් A ලෙස ලකුණු කොට නිරූපිත ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව 786/165හි ලියාපදිංචි කළ එකී අංක 270/1987 පිඹුරට අනුව, උතුරට : එම ඉඩමේම ලොට් 22 (වඩාත් නිවැරදිව ලොට් 27 හා ලොට් 22) ද, නැගෙනහිරට : එම ඉඩමේම ගුණදාස යන අයගේ ලොට් 27 හා ලොට් 25 ද, දකුණට : එම්. ඒ. හේරත් අයිතිය කියන ඉඩම ද සහ බටහිරට : එම්. ඒ. හේරත් අයිතිය කියන ඉඩම ද, මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකක් (අ. 0, රූ. 1, පර්. 1) වන සම්පූර්ණ ඉඩම එහි වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-400/3

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ණය ගිණුම් අංකය : 271638.

2008 ක් වූ මැයි 02 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ඩී. රණගල විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් දැනට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූද, 2005 දෙසැම්බර් මස 07 වැනි දින හා අංක 381 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, එලයතම්බි සාන්තසොරුබන් සහ සාන්තසොරුබන් කායල්විලි ණයකරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකසිය අසූහත් ලක්ෂ පන් දහස් හයසිය හැට හතයි ශත දොළහක (රු. 18,705,667.12) මුදලක් 2008 පෙබරවාරි මස 07 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකසිය අසූහත් ලක්ෂ පන් දහස් හයසිය හැට හතයි ශත දොළහක (රු. 18,705,667.12) මුදලට 2008 පෙබරවාරි මස 08 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු 15,920,000.00 ක මුදල

මත 26% ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 381 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බලයලත් මානක එස්. රාජේන්ද්‍ර විසින් 1961 අගෝස්තු මස 4 වැනි දින සාදන ලද අංක 2135 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු සල්පිටි කෝරළේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ වැල්ලවත්තේ පිහිටි රෝහණිපාරේ, වරිපනම් අංක 9 දරන සහ සින්සප පාරේ, පෙර වරිපනම් අංක 16 දරන ලද, පරිශ්‍රයේ කොටසක් ද, ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග බෙදා වෙන් කරන ලද කැලන්කඩුවවත්ත හෙවත් කෝන්ගහවත්ත ඉඩමේ ලොට් 'කේ 10 ඒ ' දරන ඉඩමට මායිම් උතුරට : ලොට් කේ 2 සහ කේ 3 ද, නැගෙනහිරට : කේ 10බී ද, දකුණට : ලොට් 685 බී සී 17 ද, බස්නාහිරට : ලොට් කේ 1 ද යන මායිම් තුල අංක 2135 දරන පිඹුර පරිදි පර්චස් දහතුනයි දශම පහක් (අ. 0, රූ.0, පර්. 13.5) විශාල ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල් : 161/142 වෙළුමේ පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

එකී ලොට් කේ 10 ඒ දරන ඉඩම මෑතකදී සිදුකල නැවත බෙදීම අනුව මෙසේ විස්තර කොට ඇත. (බලයලත් මානක එස්. රාජේන්ද්‍ර විසින් 1961 අගෝස්තු මස 4 වන දින සාදන ලද අංක 2135 දරන පිඹුරේ නැවත බෙදීමක් වන) බලයලත් මානක එන්. බාලසුබ්‍රමනියම් විසින් 2005 නොවැම්බර් මස 23 වැනි දින සාදන ලද අංක 108 දරන පිඹුර පරිදි එකී වැල්ලවත්තේ රෝහිණී පාර ඔස්සේ පිහිටි රෝහිණී පාරේ වරිපනම් අංක 9 දරන කැලන්කඩුවවත්ත හෙවත් කෝන්ගහවත්ත ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 7343 දරන කොටසට මායිම් : උතුරට : ලොට් 4207 සහ ලොට් 4208 දරන ඉඩම් කොටස් තුළ සින්සපා පාරේ වරිපනම් අංක 14 ද, සින්සපා පාරේ වරිපනම් අංක 16 දරන ලොට් 3165 ද, සහ රෝහිණී පාරේ වරිපනම් අංක 9/1, දරන ලොට් කේ 10 බී ද, නැගෙනහිරට : රෝහිණී පාරේ වරිපනම් අංක 9/1 දරන ලොට් කේ 10 බී සහ ලොට් 6 බී 5 බී සී 17 ද, (දැනට රෝහිණී පාර) ද, දකුණට : ලොට් 6බී5බීසී17 (දැනට රෝහිණී පාර) සහ ගාලු පාරේ වරිපනම් අංක 25 දරන ලොට් කේ 1 ද, බස්නාහිරට : ගාලු පාරේ වරිපනම් අංක 25 දරන ලොට් 4207 සහ ලොට් 4208 ද එක්ව සින්සපා පාරේ වරිපනම් අංක 14 සහ සින්සපා පාරේ වරිපනම් අංක 16 දරන ලොට් 3165 ද යන මායිම් තුළ අංක 108 දරන පිඹුර පරිදි පර්චස් දහතුනයි දශම පහයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 13.50) විශාල ඉඩම

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම/ලේකම්.

08-387

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංක : 1277126801 සහ 258521.

මොහමඩ් සාලි මොහමඩ් අරූස් 2008 ක් වූ අප්‍රේල් මස 4 වන දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ දැනට හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූද, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් 2005 සැප්තැම්බර් මස 13 වන දින සහතික කරන ලද අංක 1995 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, මොහමඩ් සාලි මොහමඩ් අරූස් ණයකරු හැටියට ද, පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අසූ හතර ලක්ෂ හතලිස් එක් දහස් තුන්සිය තිස්තුනයි ශත තිස් හතක (රු. 8,441,333.37) මුදලක් 2007 නොවැම්බර් මස 22 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අසූ හතර ලක්ෂ හතලිස් එක් දහස් තුන්සිය තිස්තුනයි ශත තිස් හතක (රු.8,441,333.37) මුදලට 2007 නොවැම්බර් මස 23 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,391,376.10 ක මුදල මත 20% ක සහ රු. 2,999,600 ක මුදල මත 6% ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 1995 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරයි.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ, ගාල්ල නගර සභා සීමාව තුළ වැලිවත්ත දංගෙදර වීදිය හෙවත් ඕල්කොට් මාවත, පිහිටි ගොඩනැගිලි සහ සියළු දේත් සමග වූ සහ දංගෙදර වීදිය හෙවත් ඕල්කොට් මාවතේ, ගාල්ල මහ නගර සභා වරිපනම් අංක 94 දරන ඕඩෙවත්ත හෙවත් පෙට්ටිගල ඔයේවත්ත කියන ඉඩමේ ගාල්ල දිසා අධිකරණයේ අංක පී/108 දරන නඩුවේ වාර්තාගත වී ඇති සහ බලයලත් මානක එස්. ඒ. බිබී විසින් 1957 ජනවාරි මස 04 වන දින සාදන ලද අංක 1029 පී දරන පිඹුරේ පෙන්වා ඇති සහ බලයලත් මානක ඒ. වීරසිංහ විසින් 2003 දෙසැම්බර් මස 30 වන දින සාදන ලද අංක 1049 දරන නැවත බෙදුම් පිඹුරේ ලොට් "ඒ" වශයෙන් පෙන්වා ඇති යාබද සහ ඒකාබද්ධ ඉඩම් කොටස් වන ලොට් 1 සහ 2 වේ. ලොට් "ඒ" දරන කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ (නගර සභා වරිපනම් අංක 94 ඒ දරන) ලොට් 3 සහ 4 ද, නැගෙනහිරට : පෙට්ටිගල වත්ත හරස් පාර ද, දකුණට : නගර සභා වරිපනම් අංක 92 දරන පරිශ්‍රය ද, සහ බස්නාහිරට : දංගෙදර වීදිය හෙවත් ඕල්කොට් මාවත ද යන මායිම් තුළ එකී අංක 1049 දරන පිඹුර පරිදි පර්චස් හතයි දශම තුනයි (අ. 0, රූ. 0, පර්. 7.3) ක් හෝ හේක්ටයාර්

0.0185 ක් විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 627/35 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

පහත සඳහන් පරිදි එම දේපල විස්තර කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ සහ ගාල්ල නගර සභා සීමාව තුළ වැලිවත්ත දංගෙදර වීදියේ පිහිටි ගොඩනැගිලි සහ සියලුදේත් සමග වූ ඕඩෙවත්ත හෙවත් පෙට්ටිගල ඔයේවත්ත කියන ඉඩම ගාල්ල දිසා අධිකරණයේ අංක පී/108 දරන නඩුවේ වාර්තාගත වී ඇති සහ බලයලත් මානක එස්. ඒ. බිබී විසින් 1957 ජනවාරි මස 4 වන දින සාදන ලද අංක 1029 පී දරන පිඹුරේ පෙන්වා ඇති බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 3 ද, නැගෙනහිරට : පෙට්ටිගල වත්තේ අළුත් පාර ද, දකුණට : නගර සභා වරිපනම් අංක 92 දරන පරිශ්‍රය ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 1 ද යන මායිම් තුල එකී අංක 1029 පී දරන පිඹුර පරිදි පර්චස් පහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 5.5) ක් විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 306/137 යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දූනුවිල මහත්මිය,
සමාගම/ලේකම්.

08-388

---

**සෙලාන් බැංකුව පීඑල්සී - යාපනය ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුවේ පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0850-01107192-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 අප්‍රේල් 04 වන දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී). ප්‍රසිද්ධ නොතාරිස් වී. ටී. සිවලිංගම් විසින් සහතික කරන ලද 2002 අගෝස්තු 29 දිනැති අංක 87, 2004 මැයි 19 දිනැති අංක : 350 සහ 2004 ඔක්තෝබර් 19 දිනැති අංක 425 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, සියල්ලෝම යාපනය පදිංචි ඇලෙක්සැන්ඩර් ක්ලෙන්ෂස් ලොයොලා, ඩේවිඩ් අලෙක්සැන්ඩර්, සහ රෙජිනා ඇලෙක්සැන්ඩර් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙකෝටි හැටපන්ලක්ෂ විසිපන්දහස් හත්සිය හතලිස්හතරයි ශත හැත්තෑඅටක (රු. 2,65,25,744.78) මුදලක් 2007 මැයි 31 වෙනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 2,65,25,744.78 මුදල ද, 2007 ජුනි 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 87, 350 සහ 425 බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වෙනි සහ 2 වෙනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**1 වෙනි උපලේඛනය**

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ සහ කොට්ඨාසයේ වුන්ඩිකුලි දේවස්ථානයට අයිති පෙදෙසෙහි කරෙයියූර් හි පිහිටි බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු ඒ. සී. ජෝර්ජ් විසින් සාදන ලද 1883.10.28 දිනැති අංක 530 ඒ දරන මිනුම් සැලැස්මේ ලොට් 1 සහ 2 ලෙස පෙන්නුම් කරනු ලබන සන්තිරාවන්තාරෙයි, පෙරියපුලතුවායල් සහ එලුවන්සුදුකාඩු නමැති 1 එල්එම් විසී සහ 0.1 කේ 1 ප්‍රමාණයෙන් යුතු ඉඩම නමුත් බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඇන්ඩෲ විසින් සාදන ලද 89.02.05 දිනැති අංක 470 දරන වෙනත් සැලැස්මක් අනුව එකී සැලැස්මෙ ලොට් 1 වශයෙන් පෙන්නුම් කරනු ලබන ප්‍රමාණයෙන් 1 එල්එම් විසී සහ 4.08 කේ එල්එස් සමන්විත වගා, සහ එයට අයත් වෙනත් සියලු අයිතීන් සමග ඉඩම එකී 1 එල්එම් විසී සහ 4.08 කේඑල්එස් ප්‍රමාණයෙන් යුතු ඉඩමට මායිම් : නැගෙනහිරට : තම්බිනායගම් සහ බ්‍රිජිටා භාර්යාවගේ දේපල, අඩි 8 ක් පළල පාරේ මුනත සහ ඒ. ඇන්තෝනිපිල්ලේ ගේ දේපළ ද, උතුරට : මේරියන් ගේබ්‍රියෙල් ගේ දේපළ, බස්නාහිරට : සාමියාපිල්ලේ, ජේ. සූරියදාස් සහ භාර්යාව සාරෝ, පී. තාසන් සහ ප්‍රැන්සීස්ගේ දේපළ සහ දකුණට : ඒ මරියදාස් සහ හිපොලිටා භාර්යාව සහ ඇරෝකියනාදර්ගේ දේපළ සහ මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය සමග සම්පූර්ණ ඉඩම වේ.

**2 වෙනි උපලේඛනය**

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ සහ කොට්ඨාසයේ වුන්ඩිකුලි දේවස්ථානයට අයිති පෙදෙසෙහි කරෙයියූර් හි පිහිටි ඔප්පුව මගින් ප්‍රමාණයෙන් 11එල්එම්එස් පීසී සහ 3 1/2 කේඑල්එස් යුත් පරියාර්පුලතුවායල් නමැති ඉඩම් කැබැල්ල නමුත් බලයලත් මිනින්දෝරු ඒ. සන්තියාපිල්ලේ විසින් සාදන ලද 1987.02.15 දිනැති අංක 280 වී දරන මිනුම් සැලැස්ම අනුව 7එල්එම්එස්වීසී සහ 6.7කේඑල්එස්, මෙයින් දකුණු සහ බස්නාහිර පැත්තේ දැනටමත් වෙන් කර ඇති වගා සහ අනිකුත් අයිතීන් සහ වෙනත් අයිතීන් සහ දකුණු දිසාවෙන් අඩි 10 ක් පළල පාර සමග සියල්ල ප්‍රමාණයෙන් 5එල්එම්එස්වීසී සහ 4කේඑල්එස් හැර සහ ඉතිරි 2එල්එම්එස්වීසී සහ 12.7 කේඑල්එස් දෙමහල් ගොඩනැගිලි ළිඳ සමග සහ එයට මායිම් : නැගෙනහිරට : ශාන්ත පැට්‍රික්ගේ පාර ද, උතුරට : ශාන්ත පැට්‍රික් විද්‍යාලයට අයිති දේපළ ද, බස්නාහිරට : ක්‍රිස්තෝතම් ගේ භාර්යාව වන මංගලම් ගේ දේපළ, දකුණට : අඩි 10 පළල පාර ද ප්‍රමාණයෙන් 11.9 කේඑල්එස් සහ එහි තුළ සියලු අයිතීන්, ඊට අමතරව වතුර ඇදීම සඳහා පොම්පය සවිකිරීමේ සහ විදුලිය ලබා ගැනීමේ අයිතිය සහ දකුණු පැත්තේ අඩි 10 ක් පළල පාර හරහා ගමනා ගමන අයිතිය සමග මෙය දැන් බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු එස්. නාගරත්නම් විසින් සාදන ලද 2004.08.17 දිනැති අංක 0467 දරන මිණුම් සැලැස්ම මගින් ආවරණය වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති

08-399/1

**සම්පත් බැංකුව පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1038 5000 5765.

2007 අගෝස්තු මස 30 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොළොන්නරුව, කඳුරුවෙල ගල්ලෑල්ලේ කුසුම්ගම අංක 09හි පදිංචි සේකු ඩාවුඩ් අබ්දුල් රෂීඩ් සහ සිත්ති රශීඩා සේගු (විවාහයට පෙර සාහුල් හමීඩ් සිත්ති රශීඩ්) යන දෙදෙනා බන්ධනදායින් වශයෙන් පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. රණතුංග විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 මැයි මස 09 දාතම හා අංක 366 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 ජූනි මස 01 වැනි දිනට ශ්‍රී ලංකා වලංගු මුදලින් රුපියල් දෙලක්ෂ අනූහතර දහස් දෙසිය දහසයකුත් ශත පනස් අටක (රු. 2,94,216.58ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දෙලක්ෂ අනූහතර දහස් දෙසිය දහසයකුත් ශත පනස් අටක (රු. 2,94,216.58ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දෙලක්ෂ අනූඑක් දහස් තුන්සිය හැට හතකුත් ශත හතලිස් හතක (රු. 2,91,367.47ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාසය (16%) බැගින් 2007 ජූනි මස 02 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද, සමඟ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 366 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුවේ, මැදපත්තු හා එගොඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, සුලු දිසාවේ කඳුරුවෙල ග්‍රාමයේ පිහිටි වරිපනම් අංක 229 දරන පොළොන්නරුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඉ. සං. අ. 5/8/49හි ලියාපදිංචි කොට ඇති උතුරට : ලොට් අංක 224 හා 230 ද, නැගෙනහිරට : ලොට් අංක 230 ද, දකුණට : ලොට් අංක 231 හා 232 ද සහ බටහිරට : ලොට් අංක 233. 228 හා 224 ද මායිම් වන මිනුම්පති විසින් සහතික කළ අංක අ. ජ. වි. පො. 151 පිඹුරට අනුව ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි තුනයි එකයි දෙකක් (හෙක්. 0.2312) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ කොටස එහි පස, ගහකොළ වගාවන් සහ ගොඩනැගිලි ද සමග

බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු ඩබ්ලිව්. ඒ. පියදාස සකස් කළ 2004 දෙසැම්බර් මස 26 දාතම හා අංක PO/2004/67 දරන පිඹුරට අනුව නැවත මනිනු ලැබ ලොට් 1 වශයෙන් දක්වා ඇති ඉහත බිම් කොටස, එකී පිඹුර ප්‍රකාර උතුරට : අ. ජ. වි. පො. 151හි ලොට් අංක 151 හා 230 ද, නැගෙනහිරට : අ. ජ. වි. පො. 151හි ලොට් අංක 230 ද, දකුණට : අ. ජ. වි. පො. 151හි ලොට් අංක 232, 531 හා 514 ද, සහ බටහිරට : අ. ජ. වි. පො. 151හි ලොට් අංක 228, 233 හා 224 ද මායිම් වන අතර ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් එකොළහයි දශම හතරක් (අ. 0, රූ. 2, පර්. 11.4) වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-400/2

---

**සීමාසහිත සම්පත් බැංකුව**

1990 අංක 04 දරන ලංකා බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1007 5076 1180.

2007 අප්‍රේල් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තලාතුඔය නාරංකඩුව අංක 236/A හි පදිංචි නඩරාජා ත්‍යාගරාජා සහ පල්ලෙගෙදර චන්ද්‍රිමා කුමාරි සරණපාල යන දෙදෙන බන්ධන්දායින් වශයෙන් සහ එකී තලාතුඔය, නාරංකඩුව, අංක 236/A හි පදිංචි එකී පල්ලේගෙදර චන්ද්‍රිමා කුමාරි සරණපාල යන අය උකස්කරුවන් වශයෙන් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. වීබැද්ද විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 අගෝස්තු මස 05 දාතම හා අංක 627 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2006 අගෝස්තු මස 31 වැනි දිනට ශ්‍රී ලංකා වලංගු මුදලින් රුපියල් හාරලක්ෂ අනූතුන්දහසක් (රු. 4,93,000) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් හාරලක්ෂ අනූතුන්දහස් (රු. 4,93,000) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හාරලක්ෂ අසූපන්දහසක (රු. 4,85,000) මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් 2006 සැප්තැම්බර් මස 01 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද, සමඟ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 627 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාධිපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, පාත හේවාහැට ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත හපුතලේ පල්ලෙගම ග්‍රාමයේ පිහිටි බොරුමුල්ලෙපිටිය හේන නමැති ඉඩමට/ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. පියදාස විසින් සාදන ලද 2005 මාර්තු මස 08 දාතම හා අංක 348/03/2005 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කොට නිරූපිත මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව G420/103හි ලියාපදිංචි කර ඇති එකී පිඹුරට අනුව උතුරට : පතන්වෙල වත්ත ද, නැගෙනහිරට : රටේමුල්ල සිට තලාතුඔය දක්වා දිවෙන පාර ද, දකුණට : බලයලත් මිනින්දෝරු ජී. ආර්. ඩබ්ලිව්. එම්. වීරකෝන් විසින් සාදන ලද අංක 11717 පිඹුරේ ලොට් 1 ද සහ නිරිතදිගට හා බටහිරට : බලයලත් මිනින්දෝරු ජී. ආර්. ඩබ්ලිව්. එම්. වීරකෝන් විසින් සාදන ලද අංක 5656 පිඹුරේ ලොට් 7හි ඉතිරි කොටස ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන් හා ගොඩනැගිලි ද, සමග සහ මතින් හා ඔස්සේ මාර්ග අයිතිය සමඟ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-400/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.